(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(7).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 අප්‍රේල් 26 සිකුරාදා**

---

**2024 මැයි 07 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 1),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 08 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.30,000,000,000 සිට රු.14,100,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.1,600,000,000 සිට රු.10,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2024.04. 05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 2),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 28 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 28 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 22302 ''ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 6,400,000,000 සිට රු. 2,370,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 8,320,000,000 සිට රු. 2,485,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 2,120,000,000 සිට රු. 115,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2024.04. 05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 3),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 29 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

.

# 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 29 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 23202 "බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම - බන්ධනාගාර දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.110,000,000 සිට රු.140,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.120,000,000 සිට රු.150,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2024.04. 05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 4),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 30 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 30 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 28502 “කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 700,000,000 සිට රු. 950,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 700,000,000 සිට රු. 950,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024.04.05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 5),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 31 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 31 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000 සිට රු. 160,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000 සිට රු. 70,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024.04. 05 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 6),— 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2023.12.31 වැනි දින දක්වා පමණි.)

<u>උපලේඛනය</u>

(අමුණා ඇති උපලේඛනය පරිදි)

# උපලේඛනය

## 2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2023 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2022 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතලවලට අනුව රනිල් වික්‍රමසිංහ වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය යටතේ මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00201, 02101, 11101, 11201, 11901, 12301, 16601, 17601, 18701, 20201, 20801, 22401, 22501, 23201, 23701, 24401, 25601, 28401, 29701, 30201, 30401, 30601, 31001, 32401, 32901 සහ 33701 ට අදාළ වන්නාවූ පනතේ තෙවන උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 00201 | - | - | 12,000,000 | 9,000,000 | - | - | 1 |
| 2 | ජාතික විගණන කාර්යාලය | 02101 | - | - | 70,000,000 | 63,000,000 | - | - | 2 |
| 3 | සෞඛ්‍ය අමාත්‍යවරයා | 11101 | - | - | 1,330,000,000 | 1,100,000,000 | - | - | 3 |
| 4 | විදේශ කටයුතු අමාත්‍යවරයා | 11201 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 4 |
| 5 | විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා | 11901 | - | - | 7,200,000 | 6,800,000 | - | - | 5 |
| 6 | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා | 12301 | - | - | 27,500,000 | 20,740,000 | - | - | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යවරයා | 16601 | - | - | - | - | 40,000,000 | 50,000,000 | 7 |
| 8 | වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා | 17601 | - | - | 4,800,000 | 4,200,000 | - | - | 8 |
| 9 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | 18701 | - | - | - | - | 12,000,000 | 13,500,000 | 9 |
| 10 | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 20201 | - | - | 2,800,000 | 2,000,000 | - | - | 10 |
| 11 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | - | - | 10,000,000 | 9,700,000 | - | - | 11 |
| 12 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 310,000,000 | 245,000,000 | - | - | 12 |
| 13 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | 2,400,000,000 | 1,200,000,000 | 2,400,000,000 | 800,000,000 | - | - | 13 |
| 14 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | - | - | 130,000,000 | 105,000,000 | - | - | 14 |
| 15 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 23701 | - | - | 4,500,000 | 4,000,000 | - | - | 15 |
| 16 | වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | 3,000,000 | 2,300,000 | - | - | 16 |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | - | - | 260,000,000 | 330,000,000 | 17 |
| 18 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28401 | 50,000,000 | 50,193,000 | - | - | - | - | 18 |
| 19 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 29701 | - | - | 6,000,000 | 4,500,000 | - | - | 19 |
| 20 | සමූපකාර සේවක කොමිෂන් සභාව | 30201 | - | - | 800,000 | 600,000 | - | - | 20 |
| 21 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 30401 | - | - | 8,600,000 | 7,500,000 | - | - | 21 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 22 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 450,000,000 | 420,000,000 | - | - | 22 |
| 23 | රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව | 31001 | - | - | 17,000,000 | 14,000,000 | - | - | 23 |
| 24 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 32401 | - | - | 2,500,000 | 1,900,000 | - | - | 24 |
| 25 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 32901 | - | - | 1,900,000 | 1,700,000 | - | - | 25 |
| 26 | කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 33701 | - | - | 100,000 | - | - | - | 26 |

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024. 04. 05 වැනි දින
කොළඹ 01.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 3),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2024.04.24 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සෞදි අරාබි රාජධානියේ ආණ්ඩුව අතර, 2023 ජනවාරි 26 දින ඇතිකර ගත් සම්මුතිය, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මාර්තු 19 දිනැති අංක 2376/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 නොවැම්බර් 30 දිනැති අංක 2360/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 02 දිනැති අංක 2365/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 07 දිනැති අංක 2365/84 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 19 දිනැති අංක 2372/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මාර්තු 01 දිනැති අංක 2373/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 04 දිනැති අංක 2365/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2024.04.25 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2024 ජනවාරි 04 දිනැති අංක 2365/51 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 1),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 2),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 13 දිනැති අංක 2371/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 1),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 01 දිනැති අංක 2360/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 2),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 01 දිනැති අංක 2360/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— රජයේ ඉඩම් ආඥාපනත යටතේ නියෝග,— (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 8 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 95 සහ 96 වගන්ති යටතේ සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් 2024 අප්‍රේල් 09 දින සාදන ලදුව, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තු සම්බන්ධයෙන් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 27 දිනැති අංක 2373/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව 2022,— 2007 අංක 07 දරන සමාගම් පනතේ 153 වගන්තිය යටතේ 2023.11.07 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි 2022 වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.12.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.12.13 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2024 මැයි 09 බ්‍රහස්පතින්දා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 මැයි 09 බ්‍රහස්පතින්දා)**

2039/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2023 ජනවාරි සිට මේ දක්වා සංචාරක කර්මාන්තය ආශ්‍රිතව සේවා සපයන්නන් සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතරින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සහ නොමැති හඳුනාගත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් ලියාපදිංචි කරන ක්‍රමවේදය කවරේද;

(iv) ලියාපදිංචි සේවා සපයන්නන් අතරින් 2022 ජනවාරි සිට මේ දක්වා ලියාපදිංචිය අවලංගු කළ සංඛ්‍යාව කොපමණද;

(v) එම එක් එක් සේවා සපයන්නාගේ නම, ලිපිනය, ව්‍යාපාර නාමය, ලියාපදිංචිය අවලංගු කළ දිනය, අවලංගු කිරීමට හේතුව සහ ඒ සඳහා නිර්දේශ කරන ලද නිලධාරියාගේ නම හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සංචාරක කර්මාන්තයට අදාළ සංචාරක සංගම්වලින්/ආයතනවලින්/පුද්ගලයන්ගෙන් 2022 ජනවාරි සිට මේ දක්වා සංචාරක සංවර්ධන අධිකාරියට ලැබී ඇති පැමිණිලි/අභියාචනා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි/අභියාචනා ඉදිරිපත් කළ සංගමයේ/ආයතනයේ/පුද්ගලයාගේ නම, ලිපිනය, පැමිණිල්ල/අභියාචනය ලැබුණු දිනය සහ ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත පැමිණිලි/අභියාචනා සඳහා නිසි ක්‍රියාමාර්ග නොගත්තේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2022 සිට 2023 දක්වා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති එක් එක් සේවා සපයන්නාගේ නම, ලිපිනය, ව්‍යාපාරික නාමය, ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ දිනය, තාවකාලික සහ ස්ථිර ලියාපදිංචි සහතිකය නිකුත් කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තාවකාලික සහතික හා ස්ථිර සහතික නිකුත් කිරීමට පෙර සේවා සපයනු ලබන ස්ථාන පරීක්ෂා කළේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) පරීක්ෂා කළේ නම්, දිනය, නිලධාරීන්ගේ නම්, තනතුරු, නිරීක්ෂණ, භාවිතා කළ වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය, හිමිකරුගේ නම, ගෙවූ මුදල හා ගෙවීම් සිදු කළ ආකාරය එක් එක් ස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කිසිදු පරීක්ෂාවක් නොකර තාවකාලික සහතිකය දීර්ඝ කළ සංචාරක ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් ව්‍යාපාර ස්ථානය හිමිකරුගේ නම, ව්‍යාපාර නාමය, තාවකාලික සහතිකය දීර්ඝ කළ දිනය, දීර්ඝ කිරීමට නිර්දේශ කළ නිලධාරියාගේ නම සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/2024

ගරු විජිත හේරත් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2022 සිට 2023 දක්වා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් විදේශීය රටවල ක්‍රියාත්මක කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වැඩසටහනේ නම, ක්‍රියාත්මක කරන ලද රට, දිනය, ඒ සඳහා ඉහත කාර්යාංශය විසින් දරන ලද වියදම, ගුවන් ගමන් ටිකට්පත්, නවාතැන් පහසුකම් ඇතුළුව දරන ලද වෙනත් වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩසටහන් සඳහා ඉහත කාර්යාංශය/බාහිර ආයතන නියෝජනය කරමින් සහභාගි වූ පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩසටහන සඳහා සහභාගි වූ බාහිර පුද්ගලයන් තෝරා ගන්නා ලද ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2094/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිලවරණයක් පැවැත්වීම සඳහා වෙන්නප්පුව, සිංගක්කුලිය දේවාලයේ මහා සභාව 2024.02.25 දින කැඳවා තිබූ අතර පසුව එම මහා සභාව අවලංගු කර ඇති බව දන්නේද;

(ii) එම මහා සභාව අවලංගු කිරීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කර තිබේද;

(iii) එම මහා සභාව අවලංගු කරන ලෙස දන්වා බෞද්ධ කටයුතු කොමසාරිස් හෝ වෙනත් නිලධාරියෙක් ලිපියක් නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලිපිය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සාමාජික ගාස්තු අය කර සිංගක්කුලිය දේවාලය සඳහා සාමාජිකයන් බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) මහා සභාව අවලංගු කිරීමට එරෙහිව එම දේවාලයේ සාමාජිකයන් විසින් විරෝධතා ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, මහා සභාව අවලංගු කිරීම හේතුවෙන් ඉහත දේවාලයේ සාමාජිකයන්ගේ මානව හිමිකම් හා අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2095/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රතිඅපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඉස්සන් ආනයනය කිරීමට අවසර ලබා දී තිබේද;

(ii) 2023 වර්ෂයේ ප්‍රතිඅපනයනය කිරීම සඳහා ඉස්සන් ආනයනය කරන ලද සමාගම්, ඉස්සන් වර්ගය, ප්‍රමාණය, බර, ආනයනය කරන ලද රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ප්‍රතිඅපනයනය කිරීම සඳහා ආනයනය කරන ලද ඉස්සන් දේශීය වෙළඳපළ වෙත මුදාහැරීම වැළැක්වීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉස්සන් ප්‍රතිඅපනයනය කිරීමෙන් රජයට ලැබෙන බදු වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉස්සන් ප්‍රතිඅපනයනය කරනු ලබන සමාගම්වලට එරෙහිව විරෝධතා ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම විරෝධතා සම්බන්ධයෙන් විමර්ශනය කර තිබේද;

(iii) එසේ නම්, එම විමර්ශන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2096/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු 'රොටරි වත්ත' යන ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) එම ඉඩම බදු දී තිබේ නම්, එම බදු ගැනුම්කරු, ඔහුව තෝරා ගන්නා ලද ක්‍රමවේදය, ඉහත ඉඩමෙන් බදු දී ඇති භූමි ප්‍රමාණය, අයකර ගනු ලබන බදු මුදල හා බදු කොන්දේසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩමෙන් බදු දී නොමැති භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණය බදු දීමට හෝ පවරා දීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන්/ආයතන/පාර්ශ්ව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 මැයි 10 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 ජූනි 04 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

510/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසීගිය රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් වැසීයාමට බලපාන ලද හේතු කවරේද;

(iv) එම පාසල් නැවත ආරම්භ කිරීමට හෝ එම පාසල් සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

541/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසල් ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඉදිරියේදී නව අලෙවිසල් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, නව අලෙවිසල් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) මේ වනවිට මණ්ඩලයේ වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා රජය විසින් රෝපණය කිරීම සඳහා ලබා දී ඇති පොල් පැළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ලබා දෙන ලද ප්‍රදේශ සහ පැළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පොල් පැළ නිසි පරිදි වර්ධනය වන්නේදැයි පසුවිපරම් කරන්නේද;

(iv) එම පොල් පැළ අතරින් නිසි පරිදි වර්ධනය වෙමින් පවතින පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරි වර්ෂය සඳහා බෙදා දීමට අපේක්ෂිත පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

588/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ආයතනවල සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම සේවකයන් නඩත්තු කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සියලුම පළාත් පාලන ආයතනවල පවතින නගරාධිපති, සභාපති හා මන්ත්‍රී තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන මුළු මාසික දීමනාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත්පාලන ආයතනවල සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් දරනු ලබන මුළු වියදම මාසිකව හා වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් ඇතුළු රජයේ ක්ෂේත්‍ර නිලධාරින්ට තමා සේවය කරනු ලබන කොට්ඨාසය නියෝජනය කරමින් පළාත් පාලන ඡන්දයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කරමින් සිදු කරන ලද සංශෝධනය ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2024

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව පැනවිය හැකි උපරිම දඬුවම මරණ දඬුවම බවත්;

(ii) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම මේ වනවිට සිදු නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලණු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය සම්පාදනය කර එල්ලුම් ගහ අලුත්වැඩියා කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) අලුගෝසු තනතුර සඳහා බඳවාගැනීමට පියවර ගෙන තිබේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට එරෙහිව බාධාවන් තිබේද;

(v) එසේ නම්, එම බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

612/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1978 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ රජය සතුව පැවති රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල සහ වෙනත් නිෂ්පාදන හා සේවා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් ආයතන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ආයතනයේ රජයේ හිමිකාරීත්වය ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) සඳහන් නිෂ්පාදන/සේවා ආයතනයන්ගෙන් පෞද්ගලීකරණය කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (අ)(i) සඳහන් ආයතන අතරින් මේ වනවිට බංකොලොත් වී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිදු කර ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් නඩු පවරා ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන ඇති මත්ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කර ඇති යුක්තිය වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) විධිමත් පරිදි ලියාපදිංචි කර නොමැති කල්බදු සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) කල්බදු සමාගම් විසින් විවිධ පොලී අනුපාත අය කිරීම හේතුවෙන් එම සමාගම් සමඟ ගිවිසුම්ගත වී ඇති පාර්ශ්වයන් දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්නේද;

(iv) එම සමාගම් විසින් අය කරනු ලබන පොලී අනුපාතයන් නියාමනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක කර තිබේද;

(v) කල්බදු පහසුකම් ලබා ගන්නා ලද ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1126/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද පුද්ගලයන්ට හිමි වන විශ්‍රාම වැටුප, දායක විශ්‍රාම වැටුපක් බව දන්නේද;

(ii) රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත හිමි විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් තීරණය කරන බව පත්වීම් ලිපියේ සඳහන් කර තිබේද;

(iii) එසේ නම්, ඉදිරියේදී මෙම රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, උඩවලව ජලාශය පසුගිය කාලයේ පැවති නියඟය හේතුවෙන් සිඳී ගිය බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව හා වන සතුන් ජලය නොමැති වීමෙන් දැඩි පීඩාවකට පත් වූ බවත්;

(iii) රොන්මඩ හේතුවෙන් එම ජලාශය විශාල ලෙස ගොඩ වී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) උඩවලව ජලාශයේ පවතින රොන්මඩ ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූනි 05 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1152/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කර තිබේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය විවෘත කරනු ලබන දිනය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය තුළින් අස්වද්දනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 වසරේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ ප්‍රගතිය;

(ii) ඉහත කොමිෂන් සභා වාර්තාව මෙම සභාවට සහ මහජනතාවට ලබා දෙනු ලබන දිනය; සහ

(iii) එම විමර්ශනයේ ප්‍රගතියක් නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රහාර සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද එම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට හේතු;

(ii) ඉහත කාරක සභාවේ ප්‍රගතිය;

(iii) ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු; සහ

(iv) ඉහත කමිටුවේ පරාමිතීන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එකී ප්‍රහාර සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම් රජය දිගින් දිගටම නොසලකා හැර තිබීමට හේතු කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානි තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1281/2024

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ ඒ සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මේ වනවිට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

(vi) ඒවායේ වැඩ කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/2024

ගරු අසංක නවරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පුරප්පාඩු පිරවීම ප්‍රමාද වන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 ජූනි 06 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1285/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කරනු ලබන භෞත චිකිත්සකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් භෞත චිකිත්සකවරයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් භෞත චිකිත්සකවරුන්ගේ රාජකාරි ස්වභාවය කවරේද;

(iv) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වර්තමාන පසුබෑම මගහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1700/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හදිසි මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අංක 2022/MSD/V/R/P/0066 ටෙන්ඩර්ය යටතේ මිලදී ගැනීම සඳහා අනුමත වූ ඖෂධ වර්ග තිස් දෙක (32) කවරේද;

(ii) එම ඖෂධ අතරින් සපයන ලද ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ලියාපදිංචි කර තිබේද;

(iv) ඉහත ටෙන්ඩරය ප්‍රදානය කිරීමේදී සම්මත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඖෂධ භාවිතා කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක වාර්තා වී තිබේද;

(ii) එම ඖෂධ සඳහා වැඩ ඇණවුම් ඉල්ලීම ලබා දුන්නේ කවුරුන්ද;

(iii) සෙල්සියස් අංශක 2 - 8 අතර උෂ්ණත්වයක් යටතේ ලබා දිය යුතු සමහර ඖෂධ ඉහත ඇණවුම තුළ අන්තර්ගත වී තිබියදී, වෛද්‍ය සැපයුම් අංශය විසින් එම ඇණවුම සඳහා අනුමතිය ලබා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1727/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව සහ වන අලින් සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) භාවිතයට නොගන්නා වී ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1749/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යමය ආධාරයක් ලබා දෙන්නේද;

(ii) එම මූල්‍යමය ආධාරය කොපමණද;

(iii) එම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ආධාරය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූල්‍යමය ආධාරය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මේ වනවිට එම අධාරය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාරය ලබා දෙන්නේද;

(iii) එසේ නම් එම දිනය කවරේද;

(iv) ස්ථිර නිවසක් නොමැති වකුගඩු රෝගීන් සිටින පවුල් සඳහා නිවසක් ඉදිකර දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1873/2024

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණ නඩු කටයුතු වලට පත්කරන ලද සහ මාරුවීම් ලබාදෙන ලද විනිශ්වයකාරවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත මාරුවීම් විනිශ්වයකාරවරුන්ට මාරුවීම් ලබාදෙන සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලදේද් ද;

(iii) නො එසේ නම්, ඉහත මාරුවීම් වලට හේතු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

1876/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පාසල් අධ්‍යාපනය ලබන සිසුවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සනීපාරක්ෂක තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ඔවුන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩසටහන සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) සියලු පාසල් සිසුවියන් ආවරණය වන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1908/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ වර්ෂ 2024 සිට 2026 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිළිඳු හා අන්ත දිළිඳු පවුල් ලක්ෂ 12ක් සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂිත කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1911/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල්තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 ජූනි 07 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1916/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව ඖෂධ පැළෑටි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) ඒවා අපනයනය කිරීමෙන් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1939/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් පෞද්ගලික අංශයට බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මඟින් අධිකාරිය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1967/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සංඛ්‍යාව අතරින් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත වැටලීම් සංඛ්‍යාව අතරින් සමථයකට පත් කරගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iv) පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා අධිකාරියේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1993/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.07.01 දින පොලිස් නිලධාරින් සමඟ පැමිණි සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ පාලන අධිකාරිය විසින් ඔංඩුම නිවාස සංකීර්ණයේ නිවාසවල ජලය හා විදුලිය විසන්ධි කර ඇති බවත්;

(ii) විශ්‍රාම ගන්වන අවස්ථාවේදී යැපෙන්නන් බඳවාගැනීමට හෝ පදිංචිය සඳහා ඉඩමක් ලබා දීමට, 1983-1986 කාලයේදී එම නිවාස සංකීර්ණයේ නිවාසවල සේවකයන්ව පදිංචි කරවන අවස්ථාවේදී පාලන අධිකාරිය විසින් පොරොන්දු වී ඇති බව ත්;

(iii) වර්ෂ 30-40ක් තිස්සේ එම නිවාසවල පදිංචි වී සිටිමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම සේවකයන් ක්‍රියා කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පදිංචිව සිටින සේවකයන්ට අසාධාරණ ලෙස සලකමින් ආයතනයේ ඉඩම් කැබලි පදිංචි වීම සඳහා වෙනත් බාහිර පුද්ගලයන්ට ලබා දෙන බව දන්නේද;

(ii) ඉහත නිවාසවල පදිංචි වි සිටින සේවකයන්ට තවදුරටත් එම නිවාසවල රැඳී සිටීමට අවසර දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

2006/2024

ගරු මයන්ත දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය දරන, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අරමුදලේ ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් වෙනත් වැඩසටහන් සඳහා භාවිතා කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/2024

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමන්තුරේ, කල්මුණේ, පොතුවිල්, එරාවූර් සහ මරදමුණේ යන ස්ථානවල 2014.02.05 දින සිට Privelth Global (Pvt.) Ltd. යන නමින් මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යන ලද බවත්;

(ii) එම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ලද අහමඩ් ෂෙරීම් මුහම්මදු සිහාෆ් (සිහාෆ් ෂෙරීම්) සහ ෆාතිමා ෆර්සානා මාර්කාර් යන අය විසින් පුද්ගලයන් 1400 දෙනෙකුගේ රුපියල් කෝටි 170 කට අධික මුදලක් වංචා කර ඇති බවත්;

(iii) ඉහත සඳහන් අධ්‍යක්ෂවරයා සහ ඔහුගේ පවුලේ අය මේ වනවිට ඉන්දියාවේ සැඟවී සිටින බවත්;

(iv) මේ සම්බන්ධයෙන් කල්මුණේ සහ සමන්තුරේ පොලිස් ස්ථාන වෙත පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට රැගෙන ඒමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව ග්‍රාම නිලධාරි වසම්වල සේවය කරනු ලබන ආර්ථික සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරින්, සංවර්ධන නිලධාරින් ලෙස රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද වර්ෂය කවරේද;

(iii) එම සංවර්ධන නිලධාරින්ට ලබා දී ඇති රාජකාරි ලැයිස්තුව කවරේද;

(iv) එම සංවර්ධන නිලධාරින් රජයේ ගුරු සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/2024

ගරු වේලු කුමාර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලමාන ග්‍රාම නිලධාරි වසමේ කැණීම් කර්මාන්තයේ නිරත වන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට නිකුත් කර ඇති බලපත්‍ර වර්ගය කවරේද;

(iii) එම ආයතනය විසින් කණිනු ලබන ඛනිජ ද්‍රව්‍ය කවරේද;

(iv) ඉහත ආයතනය විසින් කැණීම් සිදු කරනු ලබන ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩමේ අයිතිකරුවන් කවරේද;

යන්න එතුමා මෙම එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කැණීම් කටයුතු නියමිත ප්‍රමිතීන්ට අනුව සිදු කර තිබේද:

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

2075/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා, නව විදුලිය සම්බන්ධතා ලබා දීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් තැන්පතු ලෙස අයකර ගෙන ඇති මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තැන්පත් මුදල් වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි පාරිභෝගිකයන්ට ගෙවීමට ඇති පොළී මුදල කොපමණද;

(iii) එම පොළී මුදල් විදුලි පාරිභෝගිකයන්ට කඩිනමින් ගෙවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2084/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ක්ෂේත්‍රය නඟාසිටුවීම සඳහා බ්‍රිතාන්‍යයේ ප්‍රසිද්ධ රක්ෂණ සමාගමකින් ශ්‍රී ලංකාවට රුපියල් කෝටි 4100ක දෙමුහුන් ප්‍රදානයක් ලැබීමට නියමිත බවත්;

(ii) එම ප්‍රදානය ලැබීම වැළැක්වීම සඳහා මහා පරිමාණ ව්‍යාපාරිකයන් පිරිසක් උත්සාහ කරන බවට ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරික සංගමය පෙන්වා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ලබා දීමට නියමිත එම දෙමුහුන් ප්‍රදානය ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?